# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1769/4 - 2012 ජූලි මස 30 වැනි සඳුදා - 2012.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

නිවේදනය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන විෂයභාර අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතෙහි 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා සභිකවරුන්ට කාරක සභා සහභාගිත්ව දීමනා සඳහා රීති මෙයින් පනවනු ලැබේ.

මෙම රීති බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කර ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට වලංගු වේ.

ප්‍රසන්න රණතුංග,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාවේ,<br>
ප්‍රධාන අමාත්‍ය හා මුදල් ක්‍රමසම්පාදන,<br>
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන,<br>
පළාත් පරිපාලන, විදුලි බල හා බලශක්ති,<br>
මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය,<br>
බස්නාහිර පළාත.

2012 ජූලි මස 20 වැනි දින,<br>
කොළඹ 07,<br>
ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,<br>
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

**රීති**

1. මෙම රීති ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා සභිකවරුන්ට අදාළ කාරක සභා සහභාගිත්ව දීමනා සඳහා රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ප්‍රාදේශීය සභාවක සභාපති, උප සභාපති හෝ සභිකවරයෙකු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12 වැනි වගන්තිය යටතේ පත්කරනු ලබන කාරක සභාවක සාමාජිකයෙකු වන අවස්ථාවකදී එකී කාරක සභාව රැස්වන සෑම දිනයක් සඳහාම සහභාගි වීම වෙනුවෙන් එක් රැස්වීමක් සඳහා රු.500ක් බැගින් වූ දීමනාවක් ප්‍රාදේශීය සභා පොදු අරමුදලෙන් ගෙවනු ලැබිය හැකිය.

1A - PG 001379— 435 (2012/07)

3. ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා නොවන යම් සභිකවරයෙකු පත් කරනු ලබන යම් කාරක සභාවක එක් වාරෙකට වඩා වැඩි සංඛ්‍යාවක් සාමාජිකත්වය ලැබීමට පෙරාතුව සභාවේ සියලුම සභිකවරුන් එක් කාරක සභාවක හෝ සාමාජිකත්වය ලබා සිටිය යුතු ය.

4. මෙම නියෝග යටතේ දීමනා ලැබිය හැකි උපරිම කාරක සභා සංඛ්‍යාව, මසකට කාරක සභා වාර හතරක් විය යුතු ය.

08-471/1

---

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

නිවේදනය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන විෂයභාර අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතෙහි 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥා පනතේ 193 (1) (උඋ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ නගර සභා සභාපති, උපසභාපති හා සභිකවරුන්ට කාරක සභා සහභාගිත්ව දීමනා සඳහා රීති මෙයින් පනවනු ලැබේ.

මෙම රීති බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කර ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට වලංගු වේ.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය හා මුදල් ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන,
පළාත් පරිපාලන, විදුලි බල හා බලශක්ති,
මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය,
බස්නාහිර පළාත.

2012 ජූලි මස 20 වැනි දින,
කොළඹ 07,
ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

**රීති**

1. මෙම රීති නගර සභා සභාපති, උප සභාපති හා සභිකවරුන්ට අදාළ කාරක සභා සහභාගිත්ව දීමනා සඳහා රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. නගර සභාවක සභාපති, උප සභාපති හෝ සභිකවරයෙකු නගර සභා ආඥාපනතේ 255 අධිකාරය වන 29 වැනි වගන්තිය යටතේ පත්කරනු ලබන කාරක සභාවක සාමාජිකයෙකු වන අවස්ථාවක දී එකී කාරක සභාව රැස්වන සෑම දිනයක් සඳහාම සහභාගි වීම වෙනුවෙන් එක් රැස්වීමක් සඳහා රු.500ක් බැගින් වූ දීමනාවක් නගර සභා පොදු අරමුදලෙන් ගෙවනු ලැබිය හැකිය.

3. නගර සභාවක සභාපතිවරයා නොවන යම් සභිකවරයෙකු පත් කරනු ලබන යම් කාරක සභාවක එක් වාරෙකට වඩා වැඩි සංඛ්‍යාවක් සාමාජිකත්වය ලැබීමට පෙරාතුව සභාවේ සියලුම සභිකවරුන් එක් කාරක සභාවක හෝ සාමාජිකත්වය ලබා සිටිය යුතු ය.

4. මෙම නියෝග යටතේ දීමනා ලැබිය හැකි උපරිම කාරක සභා සංඛ්‍යාව, මසකට කාරක සභා වාර හතරක් විය යුතු ය.

08-471/2

බස්නාහිර පළාතේ පළාත් සභාව

නිවේදනය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන විෂයභාර අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතෙහි 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු මහ නගර සභා ආඥාපනතේ 289 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ මහ නගර සභා නගරාධිපති, උප නගරාධිපති හා සභිකවරුන්ට ස්ථාවර කමිටු සහභාගිත්ව දීමනා සඳහා නියෝග මෙයින් පනවනු ලැබේ.

මෙම නියෝග බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කර ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට වලංගු වේ.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය හා මුදල් ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන,
පළාත් පරිපාලන, විදුලි බල හා බලශක්ති,
මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය,
බස්නාහිර පළාත.

2012 ජූලි මස 20 වැනි දින,
කොළඹ 07,
ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

නියෝග

1. මෙම නියෝග මහ නගර සභා නගරාධිපති, උප නගරාධිපති හා සභිකවරුන්ට අදාළ ස්ථාවර කමිටු සහභාගිත්ව දීමනා සඳහා නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මහ නගර සභාවක නගරාධිපති, උප නගරාධිපති හෝ සභිකවරයෙකු 252 අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ පත්කරනු ලබන ස්ථාවර කමිටුවක සාමාජිකයෙකු වන අවස්ථාවක දී එකී ස්ථාවර කමිටුව රැස්වන සෑම දිනයක් සඳහාම සහභාගිවීම වෙනුවෙන් එක් රැස්වීමක් සඳහා රු.500ක් බැගින් වූ දීමනාවක් මහ නගර සභා පොදු අරමුදලෙන් ගෙවනු ලැබිය හැකිය.

3. මහ නගර සභාවක නගරාධිපතිවරයා නොවන යම් සභිකවරයෙකු පත් කරනු ලබන යම් ස්ථාවර කමිටුවක එක් වාරෙකට වඩා වැඩි සංඛ්‍යාවක් සාමාජිකත්වය ලැබීමට පෙරාතුව සභාවේ සියලුම සභිකවරුන් එක් කමිටුවක හෝ සාමාජිකත්වය ලබා සිටිය යුතු ය.

4. මෙම නියෝග යටතේ දීමනා ලැබිය හැකි උපරිම ස්ථාවර කමිටු සංඛ්‍යාව, මසකට ස්ථාවර කමිටු වාර හතරක් විය යුතු ය.

08-471/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.